// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2343/12 - 2023 අගෝස්තු මස 02 වැනි බදාදා - 2023.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ජීසීඑෆ්/අත්/NG/50/එල්ආර්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : L/O3J/94/LRB/160.

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජලය රඳවා තැබීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පවරාගන්නා ලද ඉඩමේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 514 ඒ, වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලිකඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017.11.22 දිනැතිව පිළියෙල කර ඇති අංක කොː 9709 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5784 ක්වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි දෙක (02).

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ආරච්චිය කුඹුර; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම සහ වගුරු බිම, තාවකාලික ගොඩනැගිල්ලක් සහ තාවකාලික ගොඩනැගිලි 17 ක කොටස් පිහිටා ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: -; ප්‍රමාණය: හෙක්. 0.0510.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: ආරච්චිය කුඹුර; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම සහ වගුරු බිම, තාවකාලික ගොඩනැගිලි 23 ක් සහ තාවකාලික ගොඩනැගිලි 16 ක කොටස් පිහිටා ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පූජ්‍ය බටුගම්පොල ඉන්ද්‍රසිරි හිමි; ප්‍රමාණය: හෙක්. 0.5274.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.09.18 වැනි දින පෙ.ව. 10.00 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ

1A - G 040006 - 14 (2023/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අංක : 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටුවා ඇති මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.09.11 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. තිලකවර්ධන,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2023.07.26
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
අත්කර ගැනීමේ නිලධාරී කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.

EOG 08 - 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.